# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (විශේෂ) - දෙවන වසර

## සෙමෙස්තර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/2017

## DMG 2218: සංක්‍රමණ අධ්‍යයනය

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න** **කාලය: පැය දෙක (02) යි**

**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ**

---

1. අ) ජනගහන අධ්‍යයනයේදී සංක්‍රමණය පිළිබඳව හැදෑරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණය විශ්ලේෂණය කිරීම සඳහා තිබෙන දත්තවල ප්‍රමාණවත්භාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

2. අ) 'සාමාන්‍ය පදිංචි ස්ථානයේ නැවතී සිටි කාලය අනුව ඇස්තමේන්තු කළ විට ලැබෙන සංක්‍රමණිකයන් සංඛ්‍යාව උපන් ස්ථානය අනුව ඇස්තමේන්තු කළ විට ලැබෙන සංක්‍රමණිකයන් සංඛ්‍යාවට වඩා වැඩිවේ'. මෙම කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) වර්ෂ 1970 ගණන්වල සිට ආසියාවේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණ රටාවේ සිදුවූ වෙනස්කම් නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

3. 'රැවෙන්ස්ටයින්ගේ සංක්‍රමණ නියමයන් (Raventein's Laws of Migration) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණ රටා විමර්ශනය කිරීමෙහිලා කෙතෙක් දුරට වලංගු වන්නේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4. අ) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණය විශ්ලේෂණය කිරීමෙහිලා භාවිතා කළහැකි ඍජු සහ වක්‍ර මිනුම් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) රටක අභ්‍යන්තර සංක්‍රමණය විශ්ලේෂණය කිරීමෙහිලා උපන් ස්ථානය අනුව සංක්‍රමණිකයන් හඳුනා ගන්නා ක්‍රමය යොදා ගැනීමේ තිබෙන වාසි සහ අවාසි මොනවාද?

(ලකුණු 06)

ඇ) 1946 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණ රටා සහ ප්‍රවණතා පැහැදිලි කරන්න.

(ලකුණු 08)

5. අ) 2008 වසරේදී ශ්‍රී ලංකාවට ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තියක් සකස් කිරීමට පාදක වූ කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) 2008 වසරේදී ශ්‍රී ලංකාවට සකස් කළ ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තියේ අරමුණක් වන 'සංක්‍රමණිකයන් සහ ඔවුන්ගේ පවුල් ආරක්‍ෂා කිරීම සහ බලය පැවරීම' සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති මූලික කරුණු (key issues) පැහැදිලි කරන්න.

(ලකුණු 14)